# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1394/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 28/08/2024
පැය 2330

## මාධ්‍ය නිවේදනය

### අතුරුගිරිය පොලිස් වසමේ වෙඩි තබා පුද්ගලයින් දෙදෙනෙකු ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පානදුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.07.08 වන දින අතුරුගිරිය පොලිස් වසමේදී වෙඩි තබා පුද්ගලයින් දෙදෙනෙකු ඝාතනය කර සිව් දෙනෙකුට බරපතල තුවාල සිදුකිරීමේ සිද්ධිය සම්බන්ධව විමර්ශන සිදු කරමින් තිබියදී පානදුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2024.08.28 වන දින සවස් කාලයේ පින්වත්ත පොලිස් වසමේ පිරිවෙන හංදියේ බස්නැවතුම්පල අසලදී මෙම ඝාතනයේ වෙඩික්කරුවෙකු ලෙස ක්‍රියා කල සැකකරුවෙකු හා කාර් රථය පැදවූ බවට සැකකරන පුද්ගලයා අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාර වෙඩික්කරු වයස අවුරුදු 32 ක් වන නාගොඩ, ගාල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර අනෙක් සැකකරු වයස අවුරුදු 29 ක් වූ අහුංගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් පානදුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**